# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

මෙම තනතුර 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතෙහි අංක 15 දරන වගන්තිය හා ඒවායේ උප වගන්ති ප්‍රකාරව වසර 03ක සේවා කාලයකට යටත්ව, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරක් වේ.

## අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී) තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍යවේදය (Medicine)/, ඖෂධ වෛද්‍යවේදය (Pharmacology), ඖෂධවේදය (Pharmacy) හෝ ඒ අදාළ යම් වෙනත් විෂයක් සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක් සහිත ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) කළමනාකරණ පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

වෛද්‍යවේදය (Medicine)/, ඖෂධ වෛද්‍යවේදය (Pharmacology), ඖෂධවේදය (Pharmacy) හෝ ඊට අදාළ වෙනත් විෂයක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම

**සමග**

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සමග**

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාව.

**වයස :**

(i) අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

(ii) රාජ්‍ය සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ නිලධාරියෙකු බාහිර අයදුම්කරුවෙකු ලෙස අයදුම්කරන අවස්ථාවලදී ඔවුන්ට සේවයෙන් විශ්‍රාම යාමට පෙර වසර 03ක් අවම වශයෙන් ද්විතියත පදනම මත ඉදිරියට සේවය කිරීමට හැකිවන පරිදි උපරිම වයස් සීමාව තීරණය කළ හැකිය.

**තනතුරට අදාළ වැටුප් පියවර :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 පරිදි HM 2-1 රු.(161,140 - 12 X 4,850 - 219,340) වැටුප් පරිමාණයේ 2025.01.01 දිනට නියමිත ආරම්භක වැටුප් පියවර වන රු.119,494/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව අධ්‍යක්ෂ මණ්ඩලය තෝරාගනු ලබන අයදුම්කරුවෙකු අධිකාරිය විසින් අමාත්‍යවරයා විමසා පත්කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන, වෘත්තිය සුදුසුකම් | ලකුණු 30 |
| අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | 100 |

**වෙනත් කරුණු :**

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් සමග 2025.11.08 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල, 02 වන මහල, අංක 130, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**